# මුදල් කොමිෂන් සභාව

## අතිගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරනු ලබන නිර්දේශ - 2020

**(ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ**

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ජ (4) වගන්ති ප්‍රකාරව)**

**2019 සැප්තැම්බර්**

# මුදල් කොමිෂන් සභාව

(ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 "ජ" ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලදී.)

# நிதி ஆணைக்குழு

(அரசியலமைப்பின் 154 "ண" ஆம் உறுப்புரையின் கீழ் தாபிக்கப்பட்டது)

# FINANCE COMMISSION

(Established under Article 154 "R" of the Constitution)

03, සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව.
இல. 03, சரண மாவத்தை, ராஜகிரிய, இலங்கை.
03, Sarana Mawatha, Rajagiriya, Sri Lanka.


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | FC/3/1/2019 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2019.09.03 |

අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා,
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති,
ජනාධිපති ලේකම් කාර්යාලය,
කොළඹ 01.

අතිගරු ජනාධිපතිතුමනි,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ජ (4) වගන්ති ප්‍රකාරව "රජය විසින් වාර්ෂිකව පළාත් වෙත ප්‍රදානය කරනු ලබන අරමුදල් හා ඒවා පළාත් අතර බෙදා වෙන් කිරීම පිළිබඳ මූලධර්මවලට අදාල නිර්දේශ මුදල් කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කළ යුතු වේ".

ඒ අනුව, 2020 වර්ෂය සඳහා පළාත්වල භාවිතය පිණිස වාර්ෂික අයවැයෙන් වෙන් කරනු ලබන අරමුදල් බෙදා වෙන් කිරීමට අදාල මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ මේ සමග ඉදිරිපත් කරමි.

මෙයට ඔබගේ විශ්වාසී,

උදිත එච්. පලිහක්කාර
සභාපති
මුදල් කොමිෂන් සභාව


සභාපති / தலைவர் / Chairman (+94)011 2866724
ලේකම් / செயலாளர் / Secretary (+94)011 2866824
කාර්යාලය / அலுவலகம் / Office (+94)011 2866747
ෆැක්ස් / தொலைநகல் / Fax (+94)011 2866671, (+94)011 2866679
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail info@fincom.gov.lk
www.fincom.gov.lk

## පටුන

**පිටු අංකය**


**විධායක සාරාංශය** **I**

**01. හැඳින්වීම** **01**

1.1. මුදල් කොමිෂන් සභාවේ කාර්යභාරය 01

1.2. මුදල් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යය 01

**02. ජාතික අයවැය හා පළාත් සභාවලට සැපයෙන රජයේ අරමුදල් ප්‍රදාන** **02**

2.1. රාජ්‍ය මූල්‍ය බලය බෙදා හැරීමට අදාල ව්‍යවස්ථාමය ප්‍රතිපාදන 02

2.2. පළාත්වල මූල්‍ය අවශ්‍යතා සපුරාලීම පිණිස පළාත් සභාවලට අරමුදල් වෙන් කිරීම 02

2.3. පළාත් සභාවලට වෙන් කරනු ලබන රජයේ අරමුදල් ප්‍රදාන 03

**03. පළාත් සභා විසින් අවශ්‍යතා තක්සේරු කිරීම හා රජයේ අරමුදල් සඳහා ඉල්ලුම් කිරීම** **04**

3.1. පළාත්වල සමාජ-ආර්ථික තත්ත්වයන් 04

3.2. පළාත් සභාවල සේවා සැපයුම 06

3.3. පළාත් සභාවල ප්‍රාග්ධන වියදම් අවශ්‍යතා 06

3.4. පළාත් සභාවල පුනරාවර්තන වියදම් අවශ්‍යතා 07

3.5. 2020 සඳහා පළාත්වල ප්‍රාග්ධන හා පුනරාවර්තන අයවැය අවශ්‍යතා 07

3.6. පළාත් ආදායම් මූලාශ්‍ර 08

3.7. 2020 වර්ෂය සඳහා ආදායම් පුරෝකතනය 08

**04. රජයේ වාර්ෂික අයවැයෙන් අරමුදල් වෙන් කිරීම සහ එම අරමුදල් පළාත් අතර බෙදා වෙන් කිරීම - 2020** **10**

4.1. සංයුක්ත දර්ශකය හා ප්‍රාග්ධන ස්වරූපයේ අරමුදල් බෙදා වෙන් කිරීම 10

4.2. ප්‍රාග්ධන අරමුදල් බෙදා වෙන් කිරීම සඳහා නිර්දේශ 11

4.3. පුනරාවර්තන අරමුදල් බෙදා වෙන් කිරීම සඳහා නිර්දේශ 12

**05. තුලිත සංවර්ධනය අත්කර ගැනීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමේ දී මතු වන ගැටළු සහ සීමාවන්** **13**

**06. ප්‍රතිපත්තිමය නිර්දේශ - 2020** **15**

**ඇමුණුම්**

ඇමුණුම - 01 : සාමූහික ප්‍රදාන වෙන් කිරීම් හා මුදා හැරීම් (2015 - 2019)

ඇමුණුම - 02 : පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන වෙන් කිරීම් හා මුදා හැරීම් (2015 - 2019)

ඇමුණුම - 03 : උපමාන පාදක ප්‍රදාන වෙන් කිරීම් හා මුදා හැරීම් (2015 - 2019)

ඇමුණුම - 04 : අරමුදල් වෙන් කිරීම් සූත්‍රයට අදාල තෝරාගත් විචල්‍යයන් - 2020

ඇමුණුම - 05 : මූලාශ්‍ර අනුව පළාත් ආදායම් එකතුව - 2018

විධායක සාරාංශය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දහතුන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙහි 154 ජ වගන්තියට අනුව 1987 වර්ෂයේ දී මුදල් කොමිෂන් සභාව ස්ථාපිත කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි දැක්වෙන පරිදි පළාත්වල අවශ්‍යතා සපුරාගනු පිණිස වාර්ෂික අයවැයෙන් ප්‍රමාණවත් අරමුදල් වෙන් කිරීමට අදාල නිර්දේශ මුදල් කොමිෂන් සභාව විසින් රජයට ඉදිරිපත් කළ යුතු වේ. මේ අනුව, රට තුළ තුලිත ප්‍රාදේශීය සංවර්ධනය ළඟා කර ගැනීමේ අරමුණ ඇතිව මුදල් කොමිෂන් සභාව විසින් පළාත්වල අවශ්‍යතා තක්සේරු කරනු ලබන අතර, පළාත් නවය අතර අරමුදල් බෙදා වෙන් කිරීමට අදාල මූලධර්ම පිළිබඳව නිර්දේශ ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මුදල් කොමිෂන් සභාවේ නිර්දේශයන්හි රජයේ අරමුදල් ප්‍රමාණවත් පරිදි පළාත්වලට සැපයීම හා එකී අරමුදල් තාර්කික අයුරින් පළාත් අතර බෙදා වෙන් කිරීමට අදාල මූලධර්ම, රටෙහි ජනතාවට උසස් සමාජ-ආර්ථික තත්ත්වයක් කරා ළඟා විය හැකි පරිදි තුලිත ප්‍රාදේශීය සංවර්ධනය ඇති කරලීම පිණිස වූ ප්‍රතිපත්තිමය නිර්දේශ හා උප ජාතික මට්ටමෙන් රාජ්‍ය ආයෝජන වැඩසටහන් හා සේවා සැපයුම් සඵලදායී ලෙස ක්‍රියාවට නැංවීමට අදාල ප්‍රතිපත්තිමය නිර්දේශ අන්තර්ගත වේ.

පහත දැක්වෙන ආකාරයට මුදල් කොමිෂන් සභාව විසින් රජයේ වාර්ෂික අයවැය හරහා ලැබෙන අරමුදල් පළාත් සභා වෙත ලබාදීමට නිර්දේශ කරනු ලැබේ.

(අ) පළාත් පුනරාවර්තන අවශ්‍යතා සපුරා ගැනීම සඳහා අවශ්‍ය සාමූහික ප්‍රදාන

(ආ) ප්‍රාග්ධන ස්වරූපයේ සංවර්ධන වැඩසටහන් මූල්‍යකරණය සඳහා අවශ්‍ය පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන

(ඇ) ප්‍රාග්ධන ස්වරූපයේ වැඩසටහන් සඳහා යොදාගත හැකි උපමාන පාදක ප්‍රදාන

(ඈ) බලය පවරන ලද මූලාශ්‍රවලින් ලැබෙන ආදායම් වැඩිකර ගැනීම සඳහා පෙළඹවීමක් ඇති කරනු ලබන ආදායම් කාර්යසාධන ප්‍රදාන

පළාත්වල පුනරාවර්තන ස්වරූපයේ වියදම් සඳහා අවශ්‍ය කරනු ලබන සාමූහික ප්‍රදාන තක්සේරු කිරීමේ දී හා නිර්දේශ කිරීමේදී පළාත් සභාවලට අදාල ඉලක්කගත බලය පවරන ලද ආදායම හා රජයේ ආදායම් මාරු කිරීම කෙරෙහි සැලකිල්ල යොමු කර ඇත. පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන හා උපමාන පාදක ප්‍රදාන යටතේ අරමුදල් නිර්දේශ කිරීමේදී හා එකී අරමුදල් පළාත් අතර බෙදා වෙන් කිරීමේ දී තෝරාගත් පළාත් මට්ටමේ විචල්‍යයන් කිහිපයක් මත පදනම් වූ සංයුක්ත දර්ශකයක් භාවිතා කරනු ලැබේ.

එමෙන්ම, තුලිත ප්‍රාදේශීය සංවර්ධනය අත්කර ගැනීමේදී මුහුණදීමට සිදු වන ප්‍රධාන ගැටළු හා සීමාවන් මුදල් කොමිෂන් සභාව විසින් පැහැදිලිව හඳුනාගෙන තිබෙන අතර, සඵලදායී ක්‍රියාත්මක ක්‍රමවේදයක් සහතික කරනු වස් එකී ගැටළු විසඳාලීමට අදාල නිර්දේශ ද ඉදිරිපත් කරනු ඇත.

# 1. හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154 ‘ජ’වගන්තිය යටතේ 1987 දී මුදල් කොමිෂන් සභාව පිහිටුවන ලදී.

## 1.1. මුදල් කොමිෂන් සභාවේ කාර්යභාරය

දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් මුදල් කොමිෂන් සභාව ස්ථාපිත කිරීමට හා ක්‍රියාත්මක කරලීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ‘ජ’ (3), (4) හා (5) යන වගන්තිවල මුදල් කොමිෂන් සභාවේ කාර්යභාරය පහත දැක්වෙන පරිදි නිර්වචනය කර ඇත.

154 ජ (3) මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ හා උපදෙස් මත රජය විසින් පළාත්වල අවශ්‍යතා සපුරා ගැනීමට ප්‍රමාණවත් වන පරිදි වාර්ෂික අයවැයෙන් අරමුදල් වෙන් කරනු ඇත.

154 ජ (4) පහත දැක්වෙන කරුණුවලට අදාලව ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම මුදල් කොමිෂන් සභාවේ වගකීම වේ.

- අ) රජය විසින් වාර්ෂිකව පළාත් වෙත ප්‍රදානය කරනු ලබන අරමුදල් හා ඒවා පළාත් අතර බෙදා වෙන් කිරීම පිළිබඳ වූ මූලධර්ම.
- ආ) පළාත් මූල්‍යකරණය පිළිබඳව ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාව වෙත යොමු කරනු ලබන ඕනෑම කරුණක්

154 ජ (5) මුදල් කොමිෂන් සභාව විසින් එවැනි මූලධර්ම සැකසීමේ දී තුලිත ප්‍රාදේශීය සංවර්ධනය ඇති කරගැනීමේ අරමුණ ඇතිව පහත සඳහන් කරුණු කෙරෙහි සැලකිලිමත් විය යුතුය.

- අ) එක් එක් පළාතේ ජනගහනය.
- ආ) එක් එක් පළාතේ ඒක පුද්ගල ආදායම.
- ඇ) සමාජ-ආර්ථික විෂමතාවයන් අනුක්‍රමිකව අවම කිරීමේ අවශ්‍යතාවය.
- ඈ) එක් එක් පළාතේ ඒක පුද්ගල ආදායම හා පළාත් අතර ඉහළම ඒක පුද්ගල ආදායම අතර වෙනස අවම කිරීමේ අවශ්‍යතාවය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ‘ජ’ (7) වගන්තියට අනුව මුදල් කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබන සෑම නිර්දේශයක්ම ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු අතර, ඒ පිළිබඳව ගනු ලබන ක්‍රියාමාර්ග පාර්ලිමේන්තුවට දැනුම් දිය යුතු වේ.

## 1.2. මුදල් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලබාදී ඇති බලතලවලට අනුව මුදල් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යය වනුයේ පළාත්වල අවශ්‍යතා සපුරා ගැනීම පිණිස වාර්ෂික අයවැයෙන් ප්‍රමාණවත් අරමුදල් ලබාදීම හා රට තුළ තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් උදාකර ගැනීමේ අරමුණින් පළාත් නවය අතර අරමුදල් බෙදා වෙන් කිරීම සඳහා වූ මූලධර්ම ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීමයි. මෙම ක්‍රියාවලියේ දී කාර්යක්ෂම අයුරින් අරමුදල් උපයෝජනය කිරීම පිණිස අවශ්‍යතා තක්සේරු කිරීම සහතික කරලනු වස් මුදල් කොමිෂන් සභාව විසින් පළාත් අධිකාරීන් වෙත මාර්ගෝපදේශ සපයනු ලැබේ.

ඒ අනුව, මුදල් කොමිෂන් සභාව විසින් පළාත් අවශ්‍යතාවය මනාව තක්සේරු කර පළාත් අතර අරමුදල් බෙදා වෙන් කිරීම පිළිබඳ මූලධර්ම ජනාධිපතිවරයා වෙත නිර්දේශ කරනු ලැබේ.

පළාත් අතර තාර්කික අයුරින් අරමුදල් බෙදා වෙන් කිරීම හා ඊට අදාල නිර්දේශ සැකසීම, රජයෙන් පළාත් සභාවලට ප්‍රදානය කරනු ලබන අරමුදල් ප්‍රමාණවත් ලෙස සැපයීම සහ තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් අත්කර ගැනීමට හා ජනතාවගේ සමාජ-ආර්ථික තත්ත්වය ඉහළ නැංවීමට අදාල ප්‍රතිපත්තිමය යෝජනා සැපයීම මුදල් කොමිෂන් සභාවේ නිර්දේශවලට ඇතුළත් වේ.

## 2. ජාතික අයවැය හා පළාත් සභාවලට සැපයෙන රජයේ අරමුදල් ප්‍රදාන

### 2.1. රාජ්‍ය මූල්‍ය බලය බෙදා හැරීමට අදාල ව්‍යවස්ථාමය ප්‍රතිපාදන

දහතුන් වන ව්‍යවස්ථා සංශෝධනය මගින් රාජ්‍ය පාලන ව්‍යුහය තුළ රජය, පළාත් සභා හා පළාත් පාලන ආයතන යනුවෙන් පැහැදිලි ස්තර තුනක් නිර්මාණය කර ඇත. ඒ අනුව, පළාත් සභා විසින් ක්‍රියාත්මක කළ යුතු ව්‍යවස්ථාදායක, විධායක හා මූල්‍ය අධිකාරි බලතල වෙන් වශයෙන් දක්වමින් බලය බෙදා හැරීමේ පාලන ව්‍යුහය ස්ථාපිත කර තිබේ. දහතුන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළ විශේෂිතව දක්වා ඇති ලැයිස්තු තුන හරහා රජය හා පළාත් සභාවලට අයත් විෂයයන් වෙන් වශයෙන් දක්වා ඇත. එනම්, පළාත් ලැයිස්තුව (පළාත්වලට බලය පැවරූ විෂයයන්), සංවෘත ලැයිස්තුව (රජය සතු විෂයයන්) හා සමගාමී ලැයිස්තුව (බෙදා හදාගෙන ඇති විෂයයන්) යනුවෙනි.

උප ජාතික මට්ටමේ පොදු ආයෝජන හා සේවා සැපයුම්වලට අදාල කාර්යයන් (i) රජයේ වියදම් ආයතන හා (ii) පළාත් සභා වියදම් ආයතන (පළාත් පාලන ආයතන ද ඇතුළත්ව) විසින් සිදු කෙරේ.

පළාත් විෂයයන් ඉතා පුළුල් වන අතර, ඒවාට අධ්‍යාපනය, සෞඛ්‍යය, පළාත් පාලනය, මාර්ග, කෘෂිකර්මය, වාරිමාර්ග, සමාජ සේවා, පුනරුත්ථාපන, ග්‍රාම සංවර්ධනය සහ ක්‍රීඩා යනාදිය අයත් වේ. පළාත් ලැයිස්තුව තුළ පළාත්වලට ආදායම් එකතු කළ හැකි මූලාශ්‍ර අන්තර්ගත කර ඇත. පළාත් ලැයිස්තුවේ දැක්වෙන විෂයයන්වලට අදාල කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් සභාවලට වගකීම පැවරෙන අතර, සමගාමී ලැයිස්තුවේ විෂයන් සම්බන්ධයෙන් වගකීම බෙදා හදාගැනීමේ අවකාශ ද පවතී.

### 2.2. පළාත්වල මූල්‍ය අවශ්‍යතා සපුරාලීම පිණිස පළාත් සභාවලට අරමුදල් වෙන් කිරීම

පළාත්වල අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ප්‍රමාණවත් වූ අරමුදල් රජය විසින් ලබාදිය යුතු බව ව්‍යවස්ථාවේ දැක්වේ. මෙම සන්දර්භය තුළ මුදල් කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන කාර්යයන් සිදු කරනු ලැබේ.

- රට තුළ තුලිත සංවර්ධනය ඇති වන පරිදි ජාතික අයවැයෙන් ලබාදෙන අරමුදල් පළාත් නවය අතර තාර්කිකව බෙදා වෙන් කිරීමට අදාල මූලධර්ම සැකසීම.
- එක් එක් පළාත් සභාව විසින් ජාතික අයවැය තුළින් ලබාගැනීමේ අපේක්ෂාවෙන් රජයට ඉදිරිපත් කරනු ලබන මූල්‍ය අවශ්‍යතා පදනම් කරගෙන පළාත්වල අවශ්‍යතාවයන් තීරණය කිරීම සහ නිර්දේශ සැපයීම.
- පළාත් අතර පවත්නා විෂමතාවන් අවම කිරීමේ අරමුණ ඇතිව පළාත් සභා අතර එකී අරමුදල් බෙදා වෙන් කිරීම.

**2.3.** **රජයේ අරමුදල් ප්‍රදාන පළාත් සභාවලට වෙන් කරනු ලබන රජයේ අරමුදල් ප්‍රදාන** රජයේ අරමුදල් පළාත් සභා අතර පහත දැක්වෙන අයුරින් වෙන් කරනු ලැබේ.

අ. **සාමූහික ප්‍රදාන:** පොදු සේවා සැපයුම් පවත්වා ගැනීමේ හා වැඩිදියුණු කිරීමේ අරමුණින් පළාත්වල පුනරාවර්තන වියදම් පියවා ගැනීම සඳහා මෙම ප්‍රදාන සැපයේ. පළාත් පුනරාවර්තන වියදම්වල ප්‍රධාන කොටස ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කාර්යමණ්ඩලය සඳහා ගෙවනු ලබන පුද්ගල පඩිනඩි දැක්විය හැකිය. පළාත් පාලන ආයතනවල සේවකයින්ගේ වැටුප් හා වේතන මෙන්ම සභිකයින්ගේ දීමනා ප්‍රතිපූර්ණය කිරීම සඳහා අවශ්‍ය මුදල් සහ ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීම සඳහා අවශ්‍ය මුදල් මෙම ප්‍රදානවලට අයත් වේ. 2015-2019 කාලපරිච්ඡේදය තුළ සාමූහික ප්‍රදාන වෙන් කිරීම් හා මුදා හැරීම්වලට අදාල තොරතුරු ඇමුණුම 01 මගින් දක්වා ඇත.

ආ. **පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන:** බලය පවරන ලද විෂයයන්ට අදාලව විවිධ අංශ යටතේ සිදු කෙරෙන යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන වැඩසටහන්වලට විශේෂ අවධානය යොමු කරමින් ප්‍රාග්ධන ස්වරූපයේ සංවර්ධන වැඩසටහන් සඳහා සැපයෙන අරමුදල් පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන ලෙස අර්ථ දැක්විය හැකිය. පළාත්වලට අදාල මධ්‍යකාලීන සංවර්ධන සැලැස්ම හා පළාත් වාර්ෂික සංවර්ධන වැඩසටහන මුදල් කොමිෂන් සභාව විසින් සපයන ලද මාර්ගෝපදේශවලට අනුගත වන සේ ඒකාබද්ධ සැලසුම් රාමුවක් යටතට ගැනෙන පරිදි පළාත් සභාව විසින් සකසනු ලැබේ.

මෙම පළාත් වාර්ෂික සංවර්ධන වැඩසටහන සඳහා මුදල් සැපයීම සිදු කරනුයේ විවිධ වූ අංශ යටතේය. පළාත් සංවර්ධන වැඩසටහන්හි පහත දැක්වෙන අංශ දක්නට ලැබෙන අතර, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන වෙන් කෙරෙනුයේ මෙම පළාත් විශේෂිත අංශ මුල් කරගෙනය.

| | | |
|---|---|---|
| * අධ්‍යාපන | * පළාත් මාර්ග | * ඉඩම් සංවර්ධනය |
| * බටහිර වෛද්‍ය | * වතු යටිතල පහසුකම් | * වාරිමාර්ග |
| * දේශීය වෛද්‍ය | * ප්‍රවාහන | * කෘෂිකර්මය |
| * ක්‍රීඩා | * නිවාස | * පශු සම්පත් |
| * පරිවාස හා ළමාරක්ෂණ | * ග්‍රාමීය විදුලිබල සැපයුම | * මිරිදිය ධීවර |
| * සමාජ සේවා | * පළාත් පාලනය | * කුඩා කර්මාන්ත |
| * සංස්කෘතික හා ආගමික කටයුතු | - පළාත් පාලන මාර්ග | * සංචාරක කටයුතු |
| * සමූපකාර සංවර්ධනය | - ප්‍රජා ජල සැපයුම | * ග්‍රාම සංවර්ධනය |
| * පූර්ව ළමාවිය සංවර්ධනය | - කසළ කළමනාකරණය | |

මීට අමතරව පළාත් ආයෝජන වැඩසටහන තුළ පසුව හඳුනාගනු ලබන පරතරයන් සඳහා ආයෝජනය කිරීමට හා විශේෂ අවශ්‍යතා සහිත ගම්මානවල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට හැකි වන පරිදි එක් එක් පළාත සඳහා නම්‍යශීලී අරමුදල් ප්‍රදානයක් ලබාදේ.

පළාත් නිශ්චිත සංවර්ධන අරමුදල් උපයෝජනයට අදාලව එක් එක් පළාත් සභාව විසින් මුදල් වෙන් කිරීම් සහිතව සකසන ලද වාර්ෂික සංවර්ධන වැඩසටහන අදාල පළාත් සභාවේ නිලධාරීන්ගේ සහාය ද ඇතිව මුදල් කොමිෂන් සභාව විසින් අධ්‍යයනය කරනු ලබයි. ඉන් අනතුරුව එය ක්‍රියාත්මක කිරීම සඳහා එකඟතාවය ලබාදෙනු ඇත. 2015-2019 කාලපරිච්ඡේදයට අදාලව පළාත් වාර්ෂික සංවර්ධන වැඩසටහන්

ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ වෙන් කරන ලද අරමුදල් හා නිදහස් කරන ලද අරමුදල් ප්‍රමාණයන් ඇමුණුම 02 මගින් විස්තර කර ඇත.

ඇ. **උපමාන පාදක ප්‍රදාන:** ප්‍රාදේශීය විෂමතා අඩු කිරීමේ අරමුණ ඇතිව ජනතාවගේ සමාජ-ආර්ථික තත්ත්වය ඉහළ නැංවීම සඳහා වූ ප්‍රාග්ධන ව්‍යාපෘති මූල්‍යකරණය සඳහා මෙම අරමුදල් සැපයේ. මුදල් කොමිෂන් සභාවේ මාර්ගෝපදේශවලට අනුගත වෙමින් එකඟ වූ මූල්‍ය රාමුවක් තුළ සංවර්ධන ව්‍යාපෘතිවලට අභිමතානුසාරී ලෙස වැය කිරීම සඳහා මෙම අරමුදල් පළාත් සභාවලට භාවිතා කළ හැකිය. 2015-2019 කාලපරිච්ඡේදය සඳහා උපමාන පාදක ප්‍රදාන වශයෙන් වෙන් කරන ලද මුදල් හා මුදා හැරීම් පිළිබඳ තොරතුරු ඇමුණුම 03 මගින් සපයා ඇත.

ඇ. **ආදායම් කාර්යසාධන ප්‍රදාන:** පළාත් ආදායම් ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම අරමුදල් සැපයේ. බලය බෙදා හරින ලද ආදායම් එකතුවෙහි වැඩිවීම පදනම් කරගෙන ප්‍රදානය කරනු ලබන සුළු පරිමාණ සංවර්ධන අරමුදලක් ලෙස මෙය හැඳින්විය හැකිය. ප්‍රාග්ධන ස්වරූපයේ සංවර්ධන වැඩසටහන් සඳහා මෙම අරමුදල් යෙදවීමේ අභිමතානුසාරී බලය පළාත් සභාවලට හිමි වේ. 2018 වර්ෂයේ පළාත් විසින් රැස් කරනු ලැබූ ආදායම් පිළිබඳ තොරතුරු ඇමුණුම 04 හි දක්වා ඇත.

## 3. පළාත් සභා විසින් අවශ්‍යතා තක්සේරු කිරීම හා රජයේ අරමුදල් සඳහා ඉල්ලුම් කිරීම

එක් එක් පළාත් සභාවේ ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම්වලට අදාල වාර්ෂික අරමුදල් අවශ්‍යතා පළාත් සභාව විසින් මුදල් කොමිෂන් සභාවට ඉදිරිපත් කරනු ලැබේ. අතිගරු ජනාධිපතිතුමාට හා රජයට නිර්දේශ ඉදිරිපත් කිරීමට පෙර මුදල් කොමිෂන් සභාව විසින් මෙකී ඉල්ලීම් විමර්ශනයට ලක් කෙරේ.

මෙම අවශ්‍යතා තක්සේරු කිරීමේ ක්‍රියාවලියේ දී රජයේ සංවර්ධන ප්‍රතිපත්ති රාමුව, රාජ්‍ය වියදම් කළමනාකරණය, පළාත් මධ්‍යකාලීන සංවර්ධන සැලසුම් හා පළාත් සභාවල මුදල් වියදම් කිරීමේ පෙර කාර්යසාධනය වැනි කරුණු සැලකිල්ලට ගැනේ.

### 3.1. පළාත්වල සමාජ-ආර්ථික තත්ත්වයන්

රට තුළ තුලිත සංවර්ධනය ඇති කරලීම සඳහා සියලුම ප්‍රදේශයන්හි වෙසෙන ජනතාවගේ ශුභසාධනය වැඩිදියුණු කිරීම මුල් කරගෙන උප ජාතික මට්ටම්වල දී බලය බෙදා හැරීම ක්‍රියාවට නැංවීමත් සමග සංවර්ධන ක්‍රියාවලිය ඉදිරියට ගමන් කරනු ඇත. මේ අනුව, ආර්ථික සංවර්ධනයේ ප්‍රතිලාභ විවිධ තල ඔස්සේ ව්‍යාප්ත වනු ඇත. මෙය රටෙහි විවිධ ප්‍රදේශවලට ආර්ථික අවස්ථාවන් පුළුල් ලෙස පැතිරයාම හා විවිධ ස්ථානයන් ආවරණය වන පරිදි සම්පත් පුළුල් ලෙස පැතිරයාම ලෙස අර්ථ දැක්විය හැකිය. මෙම ස්ථාන අතරට ඌන සංවර්ධිත ප්‍රදේශ හා දුරස්ථ ප්‍රදේශ අයත් වන හෙයින් හිදැස් පිරවීමේ ප්‍රවේශයක් ලෙස ප්‍රාදේශීය විෂමතා අඩු කිරීමෙහිලා මෙමගින් බලපෑම් සිදු කරනු ඇත.

අනෙකුත් පළාත් හා සංසන්දනය කරන විට බස්නාහිර පළාතෙහි වැඩිම ජනගහනය හා වැඩිම දළ දේශීය නිෂ්පාදිතය දක්නට ලැබෙන අතර, අඩුම භූමි ප්‍රමාණයකින් ද යුක්ත වේ. එමෙන්ම, උතුරු පළාත තුළ අඩුම ජනගහනය හා අඩුම දළ දේශීය නිෂ්පාදිතය නිරීක්ෂණය කළ හැකිය. විශාලම භූමි ප්‍රදේශයට උතුරු මැද පළාත අයත් වේ.

යටිතල පහසුකම් හා ප්‍රජා පහසුකම් ඉහළ නැංවීම ප්‍රාදේශීය සංවර්ධනය කෙරෙහි දායක වන අතර, ප්‍රදේශ හා උප ප්‍රදේශ මට්ටමෙන් ජනතාවගේ සමාජ-ආර්ථික තත්ත්වය ඉහළ නැංවීමට තුඩුදේ. වගු අංක 01 හි සඳහන් දර්ශක මගින් පළාත් හා ජාතික මට්ටමේ දර්ශක අතර දක්නට ලැබෙන විෂමතාවය පැහැදිලි කෙරේ. සෞඛ්‍ය

හා අධ්‍යාපන පහසුකම් වැනි මූලික අවශ්‍යතා, දරිද්‍රතාවය, සෞභාග්‍යතාවය හා සමාජ-ආර්ථික තත්ත්වයන් තුළ සැලකිය යුතු වෙනස්කම් පළාත් මට්ටමෙන් දක්නට ලැබේ (වගු අංක 02).

වගුව - **01:** පළාත්වල තෝරාගන්නා ලද සමාජ-ආර්ථික දර්ශක

| පළාත | භූමි ප්‍රමාණය (වර්ග කි.මී.) | වසර මැද ජනගහනය **2017 (‘000)** | පළාත් දළ දේ. නි. **2017** (රු.බි.) | මධ්‍යන්‍ය මාසික ඒක පුද්ගල ආදායම **2016** (රු.) (කුටුම්භයක වෙසෙන පුද්ගලයෙකුට) | විරැකියා අනුපාතය **2017 (%)** | දරිද්‍රතා අනුපාතය **2016** | සෞභාග්‍යතා දර්ශකය **2017** |
|---|---|---|---|---|---|---|---|
| බස්නාහිර | 3,593 | 6,081 | 4,949 | 14,400 | 3.2 | 1.7 | 1.28 |
| මධ්‍යම | 5,575 | 2,722 | 1,428 | 9,890 | 4.5 | 5.4 | 0.35 |
| දකුණු | 5,383 | 2,611 | 1,317 | 11,253 | 5.0 | 3 | 0.49 |
| උතුරු | 8,290 | 1,119 | 602 | 8,434 | 7.7 | 7.7 | 0.19 |
| නැගෙනහිර | 9,361 | 1,677 | 754 | 11,420 | 6.0 | 7.3 | 0.07 |
| වයඹ | 7,506 | 2,508 | 1,412 | 11,420 | 3.7 | 2.7 | 0.35 |
| උතුරු මැද | 9,741 | 1,349 | 749 | 11,248 | 4.3 | 3.3 | 0.20 |
| ඌව | 8,335 | 1,349 | 1,047 | 10,139 | 3.5 | 6.5 | 0.14 |
| සබරගමුව | 4,921 | 2,028 | 1,060 | 9,711 | 3.7 | 6.7 | 0.15 |
| ශ්‍රී ලංකාව | **62,705** | **21,444** | **13,317** | **11,307** | **4.2** | **4.1** | **0.77** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

වගුව - **02:** පළාත්වල මූලික අවශ්‍යතා සහ යටිතල පහසුකම්

| පළාත | මාර්ග ඝනත්වය 2017 | ආරක්ෂිත පානීය ජලය 2016 (කුටුම්භ %) | ආලෝකය සඳහා විදුලිබලය 2016 (කුටුම්භ %) | සනීපාරක්ෂක පහසුකම් 2016 (කුටුම්භ %) | රෝහල් සංඛ්‍යාව 2017 | පාසල් සංඛ්‍යාව 2017 | විශ්වවිද්‍යාලයට ප්‍රවේශවීමේ සංඛ්‍යාව 2017 |
|---|---|---|---|---|---|---|---|
| බස්නාහිර | 1.02 | 98.2 | 98.7 | 93.0 | 157 | 1,359 | 8,248 |
| මධ්‍යම | 0.72 | 77.7 | 96.8 | 91.5 | 170 | 1,519 | 3,224 |
| දකුණු | 0.60 | 92.7 | 98.6 | 92.8 | 120 | 1,112 | 4,525 |
| උතුරු | 0.41 | 92.3 | 92.4 | 89.1 | 105 | 997 | 2,039 |
| නැගෙනහිර | 0.24 | 97.7 | 93.2 | 90.6 | 124 | 1,110 | 2,307 |
| වයඹ | 0.55 | 92.7 | 95.9 | 90.3 | 147 | 1,256 | 3,142 |
| උතුරු මැද | 0.32 | 71.2 | 97.3 | 88.7 | 89 | 812 | 1,554 |
| ඌව | 0.42 | 79.4 | 96.0 | 92.4 | 91 | 900 | 1,770 |
| සබරගමුව | 0.82 | 76.0 | 96.4 | 91.8 | 113 | 1,129 | 2,887 |
| ශ්‍රී ලංකාව | **0.50** | **88.8** | **96.9** | **91.7** | **1,116** | **10,194** | **29,696** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, අධ්‍යාපන අමාත්‍යාංශය හා සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

සටහන: වර්ග කිලෝමීටරයට ඇති පාරවල්වල දිග

## 3.2. පළාත් සභාවල සේවා සැපයුම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදනවලට අනුව පළාත් සභා විසින් රාජ්‍ය ආයෝජන යොදවා උප ජාතික මට්ටමෙන් සේවා සැපයුම් සිදු කරනු ලැබේ. මෙම අපේක්ෂිත වගකීම් හා කාර්යයන් ඉටු කිරීමේ දී පළාත් සභා හා පළාත් පාලන ආයතන සතු කාර්යමණ්ඩල තුළින් අවශ්‍ය ආයතනික දායකත්වය සැපයේ. පළාත් විෂයයන් ඉතා පුළුල් පරාසයක පවත්නා අතර, ඊට අධ්‍යාපන, සෞඛ්‍ය, පළාත් පාලනය, මාර්ග, කෘෂිකර්මය හා වාරිමාර්ග වැනි ප්‍රධාන අංශ අයත් වේ (වගු අංක 03).

**වගුව - 03: පළාත් සභාවල සේවා සැපයුම - වත්කම්, ආයතන හා සේවා නියුක්තිකයින්**

| පළාත | මාර්ග (කි.මී.) | | පාසල් සංඛ්‍යාව 2017 | රෝහල් සංඛ්‍යාව 2017 | පළාත් පාලන ආයතන සංඛ්‍යාව 2018 | පළාත් සභාවල අනුමත කාර්ය මණ්ඩලය 2019 |
|---|---|---|---|---|---|---|
| | පළාත් | ග්‍රාමීය | | | | |
| බස්නාහිර | 1,952 | 11,180 | 1,287 | 134 | 49 | 63,111 |
| මධ්‍යම | 2,244 | 13,216 | 1,465 | 165 | 47 | 50,744 |
| දකුණු | 1,630 | 10,491 | 1,046 | 116 | 49 | 46,551 |
| උතුරු | 2,120 | 11,668 | 975 | 104 | 34 | 36,148 |
| නැගෙනහිර | 1,121 | 12,171 | 1,080 | 117 | 45 | 37,900 |
| වයඹ | 2,745 | 20,571 | 1,221 | 145 | 33 | 47,541 |
| උතුරු මැද | 1,947 | 12,709 | 802 | 87 | 27 | 29,887 |
| ඌව | 2,371 | 10,923 | 864 | 89 | 28 | 32,054 |
| සබරගමුව | 2,371 | 7,871 | 1,101 | 110 | 29 | 37,703 |
| **ශ්‍රී ලංකාව** | **18,921** | **83,956.8** | **9,841** | **1,067** | **341** | **382,639** |

මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

මෙම සන්දර්භය තුළ ස්වකීය වගකීම් කාර්යභාරය හා පළාත් මධ්‍යකාලීන හා වාර්ෂික සැලසුම්වල අඩංගු කාර්යයන් ඉටු කරමින් ජනතාවට පොදු සේවා සැපයීම වෙනුවෙන් පළාත් සභාවලට සංවර්ධනය සඳහා ප්‍රමාණවත් අරමුදල් අවශ්‍ය කෙරේ.

## 3.3. පළාත් සභාවල ප්‍රාග්ධන වියදම් අවශ්‍යතා

අන්තර් හා අභ්‍යන්තරික ප්‍රාදේශීය විෂමතා අඩු කිරීම, තුලිත හා ඒකාබද්ධ ප්‍රාදේශීය සංවර්ධනය ඇති කිරීම හා ප්‍රාදේශීය සම්පත් ප්‍රශස්ත අයුරින් යෙදවීම යන අරමුණු කේන්ද්‍ර කරගනිමින් පළාත් සභා විසින් ස්වකීය මධ්‍යකාලීන තිරසාර සංවර්ධන සැලසුම් සකස් කර ඇත. මෙම සැලසුම් ප්‍රතිඵල පාදක කරගත් බහු-ආංශික ඒකාබද්ධ සැලසුම් ප්‍රවේශයක් තුළ සකස් කර ඇත. ආංශික හා උප ආංශික කාර්යසාධන දර්ශක සහ නියමිත අභිමතාර්ථ ළඟා කර ගැනීම කේන්ද්‍ර කරගත් ආංශික වැඩසටහන් මැනෙවින් නිර්වචනය කර ඇති අතර, සාරාංශ ගත කරන ලද තාවකාලික වාර්ෂික මූල්‍ය අවශ්‍යතාවයන් සමග සමස්ත සැලසුම ඉදිරිපත් කර ඇත.

පළාත්වල මධ්‍යකාලීන ඒකාබද්ධ සැලස්මට අනුගත වන පරිදි හා අපේක්ෂිත සේවා සැපයුම් සිදු කළ හැකි වන පරිදි එක් එක් පළාත් සභාව විසින් ආයතන ප්‍රතිඵල රාමු සකස් කර තිබේ. එක් එක් පළාත් සභාවට විශේෂිත වන පරිදි සෑම සංවර්ධන අංශයකටම අදාල වියදම් ආයතනික ප්‍රතිඵල රාමුවට අන්තර්ගත කර තිබීම දැකිය හැකිය.

2019 පෙබරවාරි මාසයේ දී මුදල් කොමිෂන් සභාව විසින් 2020 වසර සඳහා ප්‍රාග්ධන අවශ්‍යතා සැකසීමට අදාල වාර්ෂික මාර්ගෝපදේශ පළාත් සභාවලට නිකුත් කරන ලදී. එහිදී, පහත දැක්වෙන කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කර ඇත.

- ජාතික සංවර්ධන ප්‍රතිපත්ති රාමුව
- උප ජාතික මට්ටමට අයත් රජයේ විශේෂ සංවර්ධන වැඩසටහන්
- තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම
- පළාත්වල භෞතික හා මානව සම්පත් ප්‍රශස්ත ලෙස උපයෝජනය කිරීම
- සංවර්ධනයේ අන්තර් හා අභ්‍යන්තරික ප්‍රාදේශීය විෂමතා අඩු කිරීම
- ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සූදානම හා ඒවායේ ශක්‍යතාවය
- රාජ්‍ය ආයෝජන වැඩසටහන සමග අනුගත වීම

## 3.4. පළාත් සභාවල පුනරාවර්තන වියදම් අවශ්‍යතා

පළාත් පුනරාවර්තන වියදම්වලින් වැඩි කොටසක් සමන්විත වනුයේ කාර්යමණ්ඩල පඩිනඩිවලින්ය. අනෙකුත් පුනරාවර්තන වියදම් තුළට ගමන්වියදම්, සැපයුම්, නඩත්තු කිරීම්, කොන්ත්‍රාත් සේවා සහ අනෙකුත් ආයතනවලට කරනු ලබන මාරු කිරීම් අයත් වේ. මෙම අනෙකුත් ආයතන ලෙස පළාත් පාලන ආයතන, පූර්ව ළමාවිය සංවර්ධන අධිකාරීන්, පළාත් මගී ප්‍රවාහන අධිකාරීන් සහ පළාත් මාර්ග සංවර්ධන අධිකාරීන් දැක්විය හැකිය. මාර්ග, ගොඩනැගිලි හා වාරිමාර්ග පද්ධති වැනි ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීම සඳහා අවශ්‍ය වන වියදම් ද අනෙකුත් පුනරාවර්තන වියදම් තුළට අයත් වේ.

2020 වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් අවශ්‍යතා හඳුනාගැනීමට අදාල මාර්ගෝපදේශ 2019 පෙබරවාරි මාසයේ දී මුදල් කොමිෂන් සභාව විසින් පළාත් සභාවලට නිකුත් කරන ලදී. එහිදී, සැලකිල්ලට ගනු ලැබූ ප්‍රධාන මූලධර්ම පහත පරිදි වේ.

- අනුමත කාර්යමණ්ඩලය
- තත්‍ය කාර්යමණ්ඩලය හා පළාත්වල පවත්නා පුරප්පාඩු
- රේඛීය අමාත්‍යාංශ විසින් පළාත් සභා සමග එකඟ වූ නව පත්වීම්
- පුද්ගල පඩිනඩි, වැටුප්, හිඟ මුදල් හා කාර්යමණ්ඩල ණය
- ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීම ඇතුළු අනෙකුත් පුනරාවර්තන වියදම් සඳහා වූ ඇස්තමේන්තු
- තෝරා පත්කර ගනු ලැබූ සභිකයින් සඳහා දීමනා
- පළාත් පාලන ආයතන හා වෙනත් ආයතනවලට මාරු කිරීම්
- රජයේ අදාල චක්‍රලේඛ

## 3.5. 2020 සඳහා පළාත්වල ප්‍රාග්ධන හා පුනරාවර්තන අයවැය අවශ්‍යතා

සියලුම පළාත් සභා විසින් 2020 වර්ෂයට අදාලව ප්‍රාග්ධන හා පුනරාවර්තන අයවැය අවශ්‍යතා සඳහා රජයේ අරමුදල් අපේක්ෂාවෙන් ඉල්ලීම් සිදු කරන ලදී.

වගුව - 04: රජයේ අරමුදල් යටතේ පළාත් සභා විසින් ප්‍රාග්ධන හා පුනරාවර්තන අයවැය අවශ්‍යතා සඳහා කරන ලද ඉල්ලීම් - 2020

(රු.මි.)

| පළාත් සභාව | ප්‍රාග්ධන අවශ්‍යතා | පුනරාවර්තන අවශ්‍යතා | | | මුළු අවශ්‍යතාවය |
|---|---|---|---|---|---|
| | | පුද්ගල පඩිනඩි | අනෙකුත් පුනරාවර්තන වියදම් | එකතුව | |
| බස්නාහිර | 6,171.7 | 50,618.4 | 31,928.3 | 82,546.7 | **88,718.4** |
| මධ්‍යම | 14,475.6 | 37,479.5 | 11,432.7 | 48,912.2 | **63,387.8** |
| දකුණු | 12780.3 | 32,132.5 | 10,300.0 | 42,432.5 | **55,212.8** |
| උතුරු | 14,639.6 | 25,215.0 | 8,017.9 | 33,232.9 | **47,872.5** |
| නැගෙනහිර | 9,125.9 | 34,445.7 | 9,998.3 | 44,444.1 | **53,569.9** |
| වයඹ | 6,967.5 | 21,689.1 | 6,343.5 | 28,032.5 | **35,000.1** |
| උතුරු මැද | 12,029.3 | 23,337.2 | 6,960.3 | 30,297.5 | **42,326.8** |
| ඌව | 7,328.0 | 30,917.2 | 8,190.0 | 39,107.2 | **46,435.2** |
| සබරගමුව | 18,619.5 | 26,114.9 | 10,034.4 | 36,149.2 | **54,768.8** |
| එකතුව | **102,137.4** | **281,949.5** | **103,205.3** | **385,154.8** | **487,292.3** |

## 3.6. පළාත් ආදායම් මූලාශ්‍ර

පළාත් ආදායම ප්‍රධාන මූලාශ්‍ර දෙකකින් සමන්විත වේ.

**i) රජයේ ආදායම මාරු කිරීම**

2010 දෙසැම්බර් මස 29 වන දින මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද අංක 01/2010 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයට අනුව රජයේ ආදායම් අධිකාරීන් වන දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්, රේගු අධ්‍යක්ෂ ජනරාල් හා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් එකතු කරන ලද ආදායම පහත දැක්වෙන පදනම මත පළාත්වලට මාරු කළ යුතු වේ.

| | | | |
|---|---|---|---|
| අ. | ජාතිය ගොඩනැගීමේ බද්දෙන් | - | 33 1/3 % |
| ආ. | මුද්දර ගාස්තු | - | 100 % |
| ඇ. | මෝටර් රථ ලියාපදිංචි ගාස්තුවෙන් | - | 70 % |

**ii) බලය පවරන ලද මූලාශ්‍රවලින් එකතු කළ ආදායම**

දහතුන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ නව වන උප ලේඛනයේ 36.01 සිට 36.20 දක්වා කොටසේ දැක්වෙන බදු හා බදු නොවන ආදායම් මගින් පළාත් සභාවලට ආදායම් එකතු කළ හැකිය. මේ අනුව, පළාත් ආදායම් මූලාශ්‍ර අතර මෝටර් රථ ලියාපදිංචි කිරීමේ ගාස්තු, සුරා බදු, මුද්දර ගාස්තු හා උසාවි දඩ ප්‍රධාන වේ. පළාත් විසින් එකතු කරනු ලබන මුද්දර ගාස්තු හා උසාවි දඩ අදාල පළාත් පාලන ආයතන වෙත මාරු කළ යුතු වේ.

## 3.7. 2020 වර්ෂය සඳහා ආදායම් පුරෝකථනය

පළාත් සඳහා ආදායම් ඉලක්ක සැකසීම ප්‍රධාන ආදායම් මූලාශ්‍ර දෙකක් මත පදනම් වේ. එනම්, රජයේ ආදායම් මාරු කිරීම හා බලය පවරන ලද ආදායම් මූලාශ්‍ර වශයෙනි. මෙම මූලාශ්‍ර දෙක යටතේ පුරෝකථනය කරන ලද ආදායම, තක්සේරු කරන ලද පළාත් පුනරාවර්තන වියදම්වලින් අඩු කරනු ලැබේ. මෙලෙස ආදායම් ඉලක්ක සැකසීමේ දී මුදල් කොමිෂන් සභාව, මහා භාණ්ඩාගාරය හා පළාත් සභා සමග උපදේශනාත්මක ක්‍රියාවලියක නිරත වේ.

**i) රජයේ ආදායම මාරු කිරීම**

පළාත් අතර බෙදා හැරිය යුතු රජයේ ආදායම් මාරු කිරීම්වලට අදාල වාර්ෂික මුළු එකතුව රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් ඇස්තමේන්තු කරනු ලබයි. අංක 01/2010 දරන 2010.12.29 දිනැති රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයට අනුව රජයේ ආදායම් මාරු කිරීමට අදාල ප්‍රතිශතයන් පහත දැක්වේ.

**වගුව - 05: පළාත්වලට රජයේ ආදායම මාරු කිරීමේ ප්‍රතිශත - 2020**

*(රු.මි.)*

| පළාත | පළාත් ප්‍රතිශතය (%) |
|---|---|
| බස්නාහිර | 48 |
| මධ්‍යම | 09 |
| දකුණු | 09 |
| උතුරු | 05 |
| වයඹ | 09 |
| උතුරු මැද | 05 |
| ඌව | 05 |
| සබරගමුව | 05 |
| නැගෙනහිර | 05 |
| **එකතුව** | **100** |

**ii) බලය පවරන ලද ආදායම් මූලාශ්‍ර සඳහා ඉලක්ක**

මුද්දර ගාස්තු හා උසාවි දඩ ඇතුළත් 2020 වසර සඳහා වූ පුරෝකථනය කරන ලද ආදායම් එකතුව රු.මි. 20,111 ක් විය. බලය පවරන ලද මූලාශ්‍ර යටතේ 2020 වසරට අදාල ආදායම් පුරෝකථන පිළිබඳ විස්තර වගු අංක 06 හි දැක්වේ.

**වගුව - 06: බලය පවරන ලද මූලාශ්‍ර යටතේ ආදායම් පුරෝකථන 2020**

*(රු.මි.)*

| පළාත | මුද්දර ගාස්තු හා උසාවි දඩ නොමැතිව ආදායම් පුරෝකථන | | | මුද්දර ගාස්තු හා උසාවි දඩ ඇතුළත්ව ආදායම් පුරෝකථන | | |
|---|---|---|---|---|---|---|
| | පළාත් ඇස්තමේන්තුව | මුදල් කොමිෂන් සභාවේ පුරෝකථන | පළාත් පංගුවේ ප්‍රතිශතය (මුදල් කොමිෂන් සභාවේ පුරෝකථන) | පළාත් ඇස්තමේන්තුව | මුදල් කොමිෂන් සභාවේ පුරෝකථන | පළාත් පංගුවේ ප්‍රතිශතය (මුදල් කොමිෂන් සභාවේ පුරෝකථන) |
| බස්නාහිර | 7,096 | 7,750 | 39 | 25,046 | 26,750 | 54 |
| මධ්‍යම | 2,067 | 2,095 | 10 | 4,137 | 4,195 | 08 |
| දකුණු | 1,904 | 2,030 | 10 | 4,224 | 4,550 | 09 |
| උතුරු | 772 | 880 | 04 | 1,697 | 1,860 | 04 |
| වයඹ | 2,494 | 2,545 | 13 | 4,869 | 4,970 | 10 |
| උතුරු මැද | 1,296 | 1,406 | 07 | 1,716 | 1,826 | 04 |
| ඌව | 919 | 1,025 | 05 | 1,359 | 1,605 | 03 |
| සබරගමුව | 1,247 | 1,375 | 07 | 2,047 | 2,275 | 05 |
| නැගෙනහිර | 946 | 1,005 | 05 | 1,636 | 1,725 | 03 |
| **එකතුව** | 18,740 | 20,111 | 100 | 46,730 | 49,756 | 100 |

2020 වර්ෂය සඳහා මුළු ආදායම් එකතුවෙන් මුද්දර බදු හා උසාවි දඩ පළාත් පාලන ආයතනවලට මාරු කළ යුතුය. පුරෝකථනය කරන ලද මුදලෙහි වටිනාකම රු.මි. 29,645 ක් විය. මුද්දර බදු හා උසාවි දඩ පළාත් පාලන ආයතනවලට පළාත් වශයෙන් බෙදී යාම වගු අංක 07 හි දැක්වේ.

**වගුව - 07: පළාත් පාලන ආයතනවලට මාරු කළ යුතු මුද්දර බදු හා උසාවි දඩ - 2020**

*(රු.මි.)*

| පළාත | මුද්දර බදු | උසාවි දඩ | එකතුව | පළාත් පංගුව (%) |
|---|---|---|---|---|
| බස්නාහිර | 18,000 | 1,000 | 19,000 | 64.1 |
| මධ්‍යම | 2,000 | 100 | 2,100 | 7.1 |
| දකුණු | 2,000 | 520 | 2,520 | 8.5 |
| උතුරු | 800 | 180 | 980 | 3.3 |
| වයඹ | 2,100 | 325 | 2,425 | 8.2 |
| උතුරු මැද | 180 | 240 | 420 | 1.4 |
| ඌව | 360 | 220 | 580 | 2.0 |
| සබරගමුව | 700 | 200 | 900 | 3.0 |
| නැගෙනහිර | 550 | 170 | 720 | 2.4 |
| **එකතුව** | **26,690** | **2,955** | **29,645** | **100.0** |

## 4. රජයේ වාර්ෂික අයවැයෙන් අරමුදල් වෙන් කිරීම සහ එම අරමුදල් පළාත් අතර බෙදා වෙන් කිරීම සඳහා වූ නිර්දේශ - 2020

### 4.1. සංයුක්ත දර්ශකය හා ප්‍රාග්ධන වියදම් සඳහා අරමුදල් බෙදා වෙන් කිරීම

පළාත් අතර ප්‍රාග්ධන අරමුදල් බෙදා හැරීමට අදාලව මුදල් කොමිෂන් සභාව විසින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව සංඛ්‍යානමය ක්‍රමවේදයක් (Statistical Formula) හඳුන්වා දෙන ලදී. මේ අනුව, මුදල් කොමිෂන් සභාව විසින් පළාත් අතර ප්‍රාග්ධන අරමුදල් තාර්කික අයුරින් බෙදා වෙන් කිරීම සඳහා "සාධක විශ්ලේෂණය" නම් වූ බහු විචල්‍ය සංඛ්‍යාත්මක ශිල්ප ක්‍රමයක් අනුගමනය කරමින් සංයුක්ත දර්ශකයක් (Composite Index) භාවිතා කරන ලදී. මෙම දර්ශකය සැකසීමේ දී පළාත් මට්ටමේ විචල්‍යයන් හඳුනාගන්නා ලදී. එම තෝරාගන්නා ලද විචල්‍යයන් පහත දැක්වෙන අතර අදාල දත්ත පළාත් වශයෙන් ඇමුණුම 05 මගින් දැක්වේ.

- මධ්‍ය වාර්ෂික ජනගහනය
- පළාත් දළ දේශීය නිෂ්පාදිතය
- දරිද්‍රතා රේඛාවට පහළින් සිටින පුද්ගල සංඛ්‍යාව
- මධ්‍යනාය මාසික ඒක පුද්ගල ආදායම
- එක් වෛද්‍යවරයෙකුට අයත් පුද්ගල සංඛ්‍යාව
- විද්‍යා විෂය ධාරාවෙන් විශ්වවිද්‍යාල ප්‍රවේශයට සුදුසුකම් ලද අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව

වගුව - 08: සංයුක්ත දර්ශකය සහ පළාත් අතර ප්‍රාග්ධන අරමුදල් බෙදා වෙන් කිරීමට අදාල ප්‍රතිශත - 2020

| පළාත | සංයුක්ත දර්ශකය | ප්‍රතිශතය |
|---|---|---|
| බස්නාහිර | 0.71179 | 7.83 % |
| මධ්‍යම | 1.01822 | 11.21 % |
| දකුණු | 0.93367 | 10.28 % |
| උතුරු | 1.17468 | 12.93 % |
| වයඹ | 0.92328 | 10.16 % |
| උතුරු මැද | 1.03606 | 11.40 % |
| ඌව | 1.05958 | 11.66 % |
| සබරගමුව | 1.08216 | 11.91 % |
| නැගෙනහිර | 1.14696 | 12.62 % |

පළාත් සභාවලට 2020 වර්ෂය සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන සහ උපමාන පාදක ප්‍රදාන යටතේ ප්‍රාග්ධන අරමුදල් වෙන් කිරීමේ දී එක් එක් පළාත්වලට අදාල වන ඉහත ප්‍රතිශත අගයන් යොදා ගන්නා ලදී.

## 4.2. ප්‍රාග්ධන අරමුදල් බෙදා වෙන් කිරීම සඳහා නිර්දේශ

පළාත් සභාවල ප්‍රාග්ධන අවශ්‍යතා ඉල්ලීම් තක්සේරු කිරීමේ දී මුදල් කොමිෂන් සභාව විසින් ගරු ආණ්ඩුකාරවරුන්, ප්‍රධාන ලේකම්වරුන්, පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන් හා ආයතන ප්‍රධානීන් සමග සාකච්ඡා වට ගණනාවක් පවත්වන ලදී.

සංයුක්ත දර්ශකය මත පදනම්ව මුදල් කොමිෂන් සභාව විසින් රජයේ වාර්ෂික අයවැයෙන් ප්‍රාග්ධන වියදම් සඳහා පළාත් සභාවලට ලබාදිය යුතු සමස්ත පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන තීරණය කරනු ලබයි.

අදාල පළාත්වල මධ්‍යකාලීන සංවර්ධන සැලැස්මෙහි දැක්වෙන ආංශික කාර්යසාධන ඉලක්කවලට අනුගත වෙමින් පළාත් සභා විසින් රජයෙන් ලැබෙන අරමුදල් සඳහා වාර්ෂික ප්‍රාග්ධන අයවැය සකසන ලදී. මෙම පළාත් ප්‍රාග්ධන ඉල්ලීම්වලට වෙනත් අරමුදල් මූලාශ්‍රවලින් අදාල මූල්‍ය වර්ෂය සඳහා ලැබීමට ඉඩකඩ පවතින අරමුදල් ඇතුළත් කර නොමැත.

ඉහත කරුණු සැලකිල්ලට ගෙන වසර 2020 සඳහා මුදල් කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන පරිදි පළාත් සභාවලට ප්‍රාග්ධන ප්‍රදාන යටතේ නිර්දේශ ඉදිරිපත් කරනු ලැබේ.

වගුව -09: පළාත් සභාවලට නිර්දේශ කරන ලද ප්‍රාග්ධන අරමුදල් ප්‍රදාන - 2020

*(රු.මි.)*

| පළාත | ප්‍රාග්ධන ප්‍රදාන - 2020 | | |
|---|---|---|---|
| | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | උපමාන පාදක ප්‍රදාන | ආදායම් කාර්යසාධන ප්‍රදාන |
| බස්නාහිර | 7,047.0 | 704.7 | 849.0 |
| මධ්‍යම | 10,089.0 | 1,008.9 | 282.0 |
| දකුණු | 9,252.0 | 925.2 | 468.0 |
| උතුරු | 11,637.0 | 1,163.7 | 396.0 |
| වයඹ | 9,144.0 | 914.4 | 333.0 |
| උතුරු මැද | 10,260.0 | 1,026.0 | 132.0 |
| ඌව | 10,494.0 | 1,049.4 | 141.0 |
| සබරගමුව | 10,719.0 | 1,071.9 | 177.0 |
| නැගෙනහිර | 11,358.0 | 1,135.8 | 222.0 |
| එකතුව | **90,000.0** | **9,000.0** | **3,000.0** |

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන හා උපමාන පාදක ප්‍රදානවලට අතිරේක වශයෙන් පළාත් ආදායම් එකතු කිරීම දිරිගැන්වීමේ ක්‍රමවේදයක් ලෙස ආදායම් කාර්යසාධන ප්‍රදාන හඳුන්වාදෙන ලදී. ඒ අනුව, මෙම නව ප්‍රදාන විශේෂය 2020 වසරේ ජාතික අයවැය තුළට ඇතුළත් කරනු ඇත. තවද, උපමාන පාදක ප්‍රදාන හා ආදායම් කාර්යසාධන ප්‍රදානයන් පළාත් අතර බෙදා දීමට නියමිත සමස්ත අරමුදල් ප්‍රමාණයෙන් සුළු ප්‍රමාණයක් වන බැවින් රජයට අතිරේක වැය බරක් නොවනු ඇත.

## 4.3. පුනරාවර්තන අරමුදල් බෙදා වෙන් කිරීම සඳහා නිර්දේශ

එක් එක් පළාත් සභාව විසින් ඉදිරිපත් කරන ලද පුනරාවර්තන අයවැය පිළිබඳව අධ්‍යයනය කිරීමෙන් අනතුරුව අවශ්‍ය කරනු ලබන පුනරාවර්තන අවශ්‍යතා තක්සේරු කරනු පිණිස අදාල පළාත් නිලධාරීන් සමග සාකච්ඡා වට ගණනාවක් පවත්වන ලදී. කෙසේවෙතත්, ඇස්තමේන්තුවල මුළු පුනරාවර්තන වියදමෙන් ඇස්තමේන්තුගත කරන ලද බලය පවරන ලද ආදායම් එකතුව අඩු කරනු ලැබේ. රජයෙන් පළාත්වලට මාරු කළ යුතු ආදායම් පිළිබඳව රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් මෙතෙක් ඇස්තමේන්තු කර නොමැති හෙයින් ඉහත සඳහන් කරන ලද රජයේ ආදායම් මාරු කිරීම් අඩු කිරීමට යටත්ව පළාත් සභාවලට ලබා දිය යුතු සාමූහික ප්‍රදාන පිළිබඳ නිර්දේශ වගු අංක 10 මගින් දක්වා ඇත.

වගුව - 10: පළාත් සභා සඳහා නිර්දේශ කරන ලද සාමූහික ප්‍රදාන - 2020

(රු. '000)

| පළාත | ඇස්තමේන්තුගත මුළු පුනරාවර්තන වියදම * | මුද්දර බදු හා උසාවි දඩ නොමැතිව පළාත් විසින් ඉදිරිපත් කරන ලද ආදායම් ඉලක්ක | මුළු සාමූහික ප්‍රදාන (මාරු කිරීම් අඩු කිරීමට පෙර) |
|---|---|---|---|
| බස්නාහිර | 66,282,976 | 7,750,000 | 58,532,976 |
| මධ්‍යම | 47,550,078 | 2,095,000 | 45,455,078 |
| දකුණු | 40,353,850 | 2,030,000 | 38,323,850 |
| උතුරු | 33,263,115 | 880,000 | 32,383,115 |
| වයඹ | 42,992,551 | 2,545,000 | 40,447,551 |
| උතුරු මැද | 27,878,598 | 1,406,000 | 26,472,598 |
| ඌව | 31,447,956 | 1,025,000 | 30,442,956 |
| සබරගමුව | 37,160,832 | 1,375,000 | 35,785,832 |
| නැගෙනහිර | 35,684,706 | 1,005,000 | 34,679,706 |
| එකතුව | **362,614,662** | **20,111,000** | **342,503,662** |

* පුරප්පාඩු හා රේඛීය අමාත්‍යාංශවල අනුයුක්ත කිරීම්වලට අදාල පුද්ගල පඩිනඩි හා වැටුප් හිඟ මුදල් ඇතුළුව

මාර්ග, ගොඩනැගිලි හා වාරිමාර්ග වැනි ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීම සඳහා යන වියදම ඇස්තමේන්තුගත මුළු පුනරාවර්තන වියදම්වලට අයත් වේ. ඊට අමතරව, අනුමත කාර්යමණ්ඩලවලට අයත් වැටුප් හා වේතන මෙන්ම සභිකයින්ගේ දීමනා පළාත් පාලන ආයතනවලට මාරු කිරීම් පිළිබඳව තොරතුරු වගු අංක 11 මගින් දැක්වේ.

වගුව - 11: පළාත් පාලන ආයතන වෙත මාරු කිරීම් - 2020

(රු. '000)

| පළාත | සභිකයින් සඳහා දීමනා | වැටුප් ප්‍රතිපූරණය | පළාත් පාලන ආයතනවලට අදාල සමස්ත මාරු කිරීම් |
|---|---|---|---|
| බස්නාහිර | 353,040 | 10,826,746 | 11,179,786 |
| මධ්‍යම | 236,880 | 3,741,964 | 3,978,844 |
| දකුණු | 213,960 | 2,818,375 | 3,032,335 |
| උතුරු | 145,800 | 2,104,526 | 2,250,326 |
| වයඹ | 181,980 | 2,334,326 | 2,516,306 |
| උතුරු මැද | 110,580 | 1,071,045 | 1,181,625 |
| ඌව | 115,235 | 1,425,519 | 1,540,754 |
| සබරගමුව | 163,450 | 1,540,266 | 1,703,716 |
| නැගෙනහිර | 172,260 | 2,059,236 | 2,231,496 |
| එකතුව | **1,693,185** | **27,922,003** | **29,615,188** |

## 5. තුලිත සංවර්ධනය අත්කර ගැනීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමේ දී මතු වන ගැටළු සහ සීමාවන්

වර්තමානයේ දී එක් එක් පළාත ස්වකීය සේවා සැපයුම් සිදු කිරීම සඳහා අවශ්‍ය අරමුදල් පහත දැක්වෙන මූලාශ්‍ර මගින් ලබාගනී.

a) මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ මත පදනම්ව ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් අවශ්‍යතා පියවා ගැනීම පිණිස ජාතික අයවැය මගින් ලබාදෙන අරමුදල් ප්‍රදාන.

b) පළාත් සභා මගින් සංවර්ධන කටයුතු සිදු කරවා ගැනීම සඳහා රේඛීය අමාත්‍යාංශ විසින් සැපයෙන වෙන් කිරීම්.

c) විශේෂ විදේශාධාර ව්‍යාපෘතිවලට අයත් පළාත් සංරචක ක්‍රියාත්මක කිරීම සඳහා වෙන් කරනු ලබන අරමුදල්.

I. ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව, ජාතික අයවැය දෙපාර්තමේන්තුව, මුදල් කොමිෂන් සභාව, පළාත් සභා සහ අනෙකුත් පාර්ශ්වකරුවන් අතර මනා සම්බන්ධීකරණයක් නොමැති බව මුදල් කොමිෂන් සභාවේ නිරීක්ෂණය වේ. සඵලදායී සම්බන්ධීකරණයක් සහිත ඒකාබද්ධ සැලසුම්කරණ යාන්ත්‍රණයක් නොමැති තත්ත්වය තුළ ස්වකීය වගකීම් ඉටු කිරීම සම්බන්ධයෙන් අදාල ආයතන අසමත්භාවයක් පෙන්නුම් කරන අතර, එය ද්විකරණයට හා සම්පත් නාස්තියට තුඩුදේ.

II. රජය විසින් පළාත්වලට ලබාදෙන ලද ප්‍රාග්ධන අරමුදල් ඉතා සුළු ප්‍රමාණයක් වන අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පළාත් සභා ලැයිස්තුවේ විෂයන්හි කාර්යභාරයන්ට අනුව සේවා සැපයීම සඳහා රජයේ මුළු ප්‍රාග්ධන අයවැයෙන් අවම වශයෙන් 25% ක් දක්වාවත් ප්‍රාග්ධන අරමුදල් ප්‍රමාණය වැඩි කළ යුතු බව පළාත් අධිකාරීන්ගේ අදහස වේ.

III. පළාත් සභාවලට බලය පවරන ලද විෂයයනට අදාලව රේඛීය අමාත්‍යාංශ හරහා ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට මෙන්ම විශේෂ ව්‍යාපෘතිවලට අයත් පළාත් සංරචක ක්‍රියාත්මක කිරීම සඳහා සැලකිය යුතු මුදල් ප්‍රමාණයක් වෙන් කරනු ලබන බව නිරීක්ෂණය කළ හැකිය. මෙම වෙන් කිරීම් පිළිබඳව මුදල් කොමිෂන් සභාවේ දැනුවත් බවක් නොමැති අතර, ඒවා කොමිෂන් සභාවේ නිර්දේශවලට පරිබාහිරව සිදු වේ. මෙම වෙන් කිරීම් ක්‍රමවත් අවශ්‍යතා තක්සේරුවකින් තොරව අක්‍රමවත් ආකාරයට සිදු වන බව මුදල් කොමිෂන් සභාවේ අදහස වේ. මෙම තත්ත්වය තුලින ප්‍රාදේශීය සංවර්ධන ක්‍රියාවලියට අහිතකර අයුරින් බලපාන අතර, ප්‍රශස්ත ලෙස සමාජ-ආර්ථික ප්‍රතිඵල අත්කර ගැනීමට බාධාවක් ද වේ.

IV. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව පළාත් සභාවක් තුළ අමාත්‍යාංශ පහක් පමණක් ස්ථාපිත කර ඇත. එසේවුවද, පළාත් මට්ටමේ අමාත්‍යාංශවලට පැවරෙන කාර්යයන් තාර්කික නොවන අයුරින් බෙදී තිබීමෙන් පළාත් සභාවල ආංශික සැලසුම්කරණය, අයවැයකරණය හා ගිණුම්කරණය අතර මනා සම්බන්ධීකරණයක් නොලැබේ. මෙම තත්ත්වය ඵලදායී අයුරින් නිවැරදි කළ යුතුව තිබේ.

V. වර්තමානයේ දක්නට ලැබෙන පරිදි බොහෝ අවස්ථාවල පළාත් මට්ටමේ කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ දී වැඩි වශයෙන් ප්‍රජා මූල සංවිධානවලට (CBOs) වැඩ ලබාදීම සඳහා උප මට්ටමේ වැඩ බෙදාදීමක් නිරීක්ෂණය කළ හැකිය. මෙම තත්ත්වය වැඩවල ගුණාත්මකභාවයට හා අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කරගැනීම කෙරෙහි අහිතකර අයුරින් බලපා ඇත.

VI. ව්‍යවස්ථාව තුළ බලය බෙදා හැරෙන ආදායම් මූලාශ්‍ර විස්සක් පමණ හඳුනාගෙන තිබුණ ද, පළාත් මට්ටමේ දී ආදායම් ඉපැයීමේ යාන්ත්‍රණය අකාර්යක්ෂම බව පෙනී යයි. මෙම තත්ත්වයට පහත දැක්වෙන සාධක බලපා තිබේ.

අ) ව්‍යාපාර පිරිවැටුම් බද්ද ප්‍රධාන ආදායම් මාර්ගය වූ අතර, මේ වන විට එය ඉවත් කර තිබීම.

ආ) ප්‍රධාන ආදායම් මූලාශ්‍ර මධ්‍යගත අයුරින් එකතු කරනු ලබන අතර, පසුව පළාත් සභාවලට බෙදා හරිනු ලැබීම.

ඇ) ආදායම්වලට අදාල නීතිමය ප්‍රතිපාදන සම්මත කරගැනීමේ හැකියාවක් පළාත් සභාවලට නොමැති අතර ඒවා පාර්ලිමේන්තුවෙන් සම්මත විය යුතු වීම.

ඈ) බොහෝ අවස්ථාවල දී බලය පවරන ලද ආදායම්වලට අදාල අනුපාතයන් පාර්ලිමේන්තුව විසින් අනුමත කළ යුතුව තිබීම.

VII. පෞද්ගලික අංශය විසින් සෞඛ්‍ය හා අධ්‍යාපන යන අංශ තුළ සැලකිය යුතු තරමේ ආයෝජන සිදුවුවද, මෙකී අංශ සඳහා සිදු කරනු ලබන රාජ්‍ය අරමුදල් වෙන් කිරීම් වැඩි වන තත්ත්වයක් දක්නට ලැබේ. මෙම තත්ත්වය තුළ ද්විකරණය ඇති වීම මෙන්ම අපේක්ෂිත ප්‍රතිඵල ප්‍රශස්ත අයුරින් අත්කර ගැනීමට නොහැකි වීම නිරීක්ෂණය කළ හැකිය. තවද, මෙම අංශ සඳහා පුද්ගලයින් විසින් දරනු ලබන වියදම් වැඩිවීමේ ප්‍රවණතාවක් ද දැකිය හැකිය.

VIII. මුදල් කොමිෂන් සභාවට ලැබෙන විගණකාධිපති වාර්තාවල පළාත් සභාවලට අදාලව සැලකිය යුතු ආකාරයේ නිරීක්ෂණ දක්නට ලැබේ. පළාත් සභාවල කාර්යයන් පාලනය කිරීමේ හෝ අධීක්ෂණය කිරීමේ බලයක් මුදල් කොමිෂන් සභාවට නොමැති හෙයින් එකී නිරීක්ෂණ සම්බන්ධ වාර්තා පළාත් ආණ්ඩුකාරවරුන්ට සහ ප්‍රධාන ලේකම්වරුන්ට පසු විපරම් කටයුතු සඳහා යොමු කිරීම පමණක් සිදු කෙරේ.

## 6. ප්‍රතිපත්තිමය නිර්දේශ - 2020

ඉහත දක්වා ඇති ගැටළු හා සීමාවන් සැලකිල්ලට ගනිමින් මුදල් කොමිෂන් සභාව විසින් පහත නිර්දේශයන් ඉදිරිපත් කරනු ලැබේ.

1. ජාතික හා ප්‍රාදේශීය මට්ටමෙන් ප්‍රතිපත්ති සැකසීමේ ක්‍රියාවලිය හා රාජ්‍ය ආයෝජන සැලසුම්කරණය සම්බන්ධයෙන් සම්බන්ධීකරණයෙහි දුර්වලතා නිරීක්ෂණය කළ හැකි අතර, එය තුලිත සංවර්ධනය ළඟා කරගැනීම මන්දගාමී වීමටත්, සමස්තයක් ලෙස රටෙහි සංවර්ධනයේ වේගය අඩු කරලීමටත් හේතු වී ඇත. මෙම තත්ත්වය තුළ මුදල් කොමිෂන් සභාව විසින් සියලුම පළාත්වල හා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව පරිපූර්ණ හා ඒකාකාර වූ ස්වරූපයේ සැලසුම් ක්‍රියාවලියක් ස්ථාපනය කිරීමේ මූලික උත්සාහයක් දරා ඇත. මින් අපේක්ෂා කෙරෙනුයේ සඵලදායී අවශ්‍යතා තක්සේරු ක්‍රියාවලියක් තුළින් සංවර්ධනය කේන්ද්‍ර කරගත් ඵලදායී ආයෝජන සහතික කරලීමයි. තවද, ජාතික හා උප ජාතික මට්ටමේ සියලුම පාර්ශ්වකරුවන්ගේ සහාය ඇතිව ඒකාබද්ධ ප්‍රවේශයක් අනුගමනය කිරීම මගින් මෙම ක්‍රියාවලිය ශක්තිමත් කරලීමට නිර්දේශ කෙරෙන අතර, බලය බෙදා හැරීමේ සංකල්පය තුළ හිඳිමින් ජාතික හා උප ජාතික මට්ටමේ සැලසුම්කරණය සඳහා පොදු රාමුවක් ස්ථාපනය කිරීමේ අවශ්‍යතාවය යෝජනා කෙරේ. මෙම කාර්යයේ දී පරිපූර්ණ ඒකාබද්ධ සැලසුම්කරණය, සඵලදායී අවශ්‍යතා තක්සේරුව හා ඒ අනුව රාජ්‍ය ආයෝජන හරහා සම්පත් වෙන් කිරීම සම්බන්ධයෙන් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව හා මුදල් කොමිෂන් සභාව විසින් නායකත්ව කාර්යභාරයන් ඉටු කළ යුතුව තිබේ.

2. දහතුන් වන ව්‍යවස්ථා සංශෝධනය මගින් විශාල පරාසයක පොදු සේවාවන් සැපයීමේ කාර්යය සඳහා පළාත් සභාවලට බලය පවරා දී තිබේ. මෙම වගකීම ඉටු කිරීමේ දී සියලුම පළාත් සභා විසින් මුදල් කොමිෂන් සභාවේ මාර්ගෝපදේශවලට අනුගත වෙමින් මධ්‍යකාලීන සංවර්ධන සැලසුම් හා වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කර ඇත. තවද, මෙම බලය පවරන ලද විෂයයන්ට අදාල කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් සභා විසින් ආයතනයන් පිහිටුවා තිබේ. වර්තමානයේ දී උප ජාතික මට්ටමෙන් සංවර්ධන කාර්යයන් සිදු කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශවලට ශක්තිමත් ධාරිතාවයක් සහිත ආයතනික ක්‍රමවේදයක් නොමැති තත්ත්වය තුළ රේඛීය අමාත්‍යංශවල ඇතැම් වැඩකටයුතු ද පළාත් සභා විසින් ඉටු කරනු ලැබේ. කෙසේවුවද, පළාත් සභාවලට බලය පවරන ලද විෂයන්ට අදාල කටයුතු කරගෙන යෑම

සඳහා රේඛීය අමාත්‍යාංශවලට අඛණ්ඩව අරමුදල් සැපයේ. බලය පවරන ලද විෂයයනට අයත් කාර්යයන් සම්බන්ධයෙන් ආයෝජනය කිරීමට ප්‍රමාණවත් අරමුදල් පළාත් සභාවලට ලබාදීමටත් එම විෂයයන් පළාත් සභාව මගින් පමණක් ක්‍රියාත්මක කරනු ලැබීමටත් නිර්දේශ කෙරේ. බලය පවරන ලද විෂයයන්වලට අදාලව ආයෝජන කටයුතු රේඛීය අමාත්‍යාංශ හරහා ක්‍රියාත්මක නොකළහොත් පළාත් සභාවලට ප්‍රමාණවත් අරමුදල් සැපයීම ජාතික අයවැයට අතිරේක බරක් නොවනු ඇත. ප්‍රමාණවත් නොවන අරමුදල් කොටසක් පමණක් පළාත් සභා අතර තාර්කික ක්‍රමවේදයක් ඔස්සේ බෙදා දීම සිදු වන බව පෙනී යයි. මෙලෙස ජාතික අයවැයෙන් සුළු ප්‍රමාණයක් පමණක් තාර්කික අයුරින් පළාත් සභා හරහා වියදම් කිරීම තුළින් රට තුළ තුලිත සංවර්ධනය ළඟා කරගැනීමේ උත්සාහය ඵලදායී නොවනු ඇත. ඒ අනුව, ජාතික අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මුදල් කොමිෂන් සභාවේ ද උපදෙස් ඇතිව පිළිගත් ක්‍රමවේදයක් අනුව තාර්කික ලෙස පළාත් අතර ස්වකීය අරමුදල් බෙදා හැරීම සිදු කළ යුතු බවට නිර්දේශ කෙරේ.

3. එකඟතාවයෙන් යුත් සංවර්ධන රාමුවක් තුළ සිටිමින් ජාතික මට්ටමෙන් හඳුනාගත් බලය පවරන ලද විෂයයනට අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පළාත් සභා හරහා සිදු කළ යුතුය. තවද, විදේශාධාර ඇතිව ක්‍රියාත්මක කරනු ලබන විශේෂ ව්‍යාපෘතිවල පළාත් සභාවලට බලය පවරා ඇති විෂයයනට අදාල පළාත් සංරචකයන් සඳහා අයවැය ප්‍රතිපාදන සෘජුවම පළාත් සභා වෙත ලබා දිය යුතු අතර, ඒවාට අදාල තොරතුරු මුදල් කොමිෂන් සභාව වෙත ලබාදීම සිදු කළ යුතු වේ. මේ තුළින් අරමුදල් ද්විකරණය හා එකම කාර්යය දෙපිරිසක් විසින් සිදු කිරීම වැනි දුර්වලතා අවම කරගත හැකි වන අතර, අරමුදල් උපයෝජනය සඵලදායී ලෙස සිදු කළ හැකිය. ඊට අමතරව පොදු ආයෝජන සම්බන්ධයෙන් විනිවිදභාවය හා වගවීම මැනෙවින් පවත්වා ගැනීමට හැකි වනු ඇත.

4. ව්‍යවස්ථාමය ප්‍රතිපාදනවලට අනුව පළාත් සභාවල ස්ථාපිත කර තිබෙනුයේ අමාත්‍යාංශ පහක් පමණි. මේ තත්ත්වය තුළ සඵලදායී හා කාර්යක්ෂම කළමනාකරණයක්, ක්‍රියාත්මක ක්‍රමවේදයක් හා පළාත් අතර අනුරූපීතාවයෙන් යුත් සම්බන්ධීකරණයක් තහවුරු කෙරෙන පරිදි අමාත්‍යාංශ පහටම අදාල කාර්යයන් සංවිධානය කිරීම අත්‍යවශ්‍ය වේ.

5. සෘජු කොන්ත්‍රාත්තු ප්‍රජා මූල සංවිධානවලට ලබාදීම තුළින් කුඩා ප්‍රමාණයේ සංවර්ධන කාර්යයන් සංඛ්‍යාත්මක ලෙස අධික වීම මුදල් කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර ඇත. මෙය ප්‍රජාවගේ යහපත පිණිස ගුණාත්මක හා ඵලදායීතාවයෙන් යුක්ත වඩා හොඳ මට්ටමේ සේවා සැපයීමක් තහවුරු කිරීමට බාධාවක්ව පවතී. මෙම තත්ත්වය තුළ සෘජු කොන්ත්‍රාත්තු ව්‍යාපෘතිය පවතින අදාල ග්‍රාම නිලධාරි වසමට අයත් සමිතිවලට පමණක් සීමා කිරීමට මුදල් කොමිෂන් සභාව නිර්දේශ කරන අතර, උප කොන්ත්‍රාත්තුවලට අවසර ලබා නොදිය යුතුය.

6. දහතුන් වන ව්‍යවස්ථා සංශෝධනය යටතේ පළාත්වලට ලබාදී තිබෙන ආදායම් මූලාශ්‍ර යටතේ ලබන ආදායම් පවරන ලද විෂයයන් හා බැඳුණු වියදම් පියවා ගැනීම සඳහා කිසිසේත් ප්‍රමාණවත් නොවන බව මුදල් කොමිෂන් සභාවේ නිරීක්ෂණය වේ. එමෙන්ම, පාර්ලිමේන්තුවේ අනුමැතිය නොමැතිව පළාත් සභාවලට කිසිදු නව ආදායම් මාර්ගයක් හඳුන්වාදීමට නුපුළුවන. මෙයට අදාල නව ප්‍රතිපත්තීන් සැකසීම අරමුණු කොටගෙන රාජ්‍ය-මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් පළාත් සභාවල සහයෝගය ද ඇතිව පුළුල් අධ්‍යයනයක් සිදු කිරීම කාලීන අවශ්‍යතාවයක් වේ. ඒ අතර, රජයට දැරීමට සිදු වන බර අඩු කරලමින් ස්වකීය ආදායම් උපරිම කර ගැනීම සඳහා පළාත් සභා විසින් ද උත්සාහ දැරීම සිදු කළ යුතුය. මේ සම්බන්ධයෙන් නව වන උප ලේඛනය යටතේ පළාත් සභා ලැයිස්තුවේ අයිතම විසි එකට අදාල ආදායම් උත්පාදන ව්‍යාපෘති පිළිබඳ අවධානය යොමු කිරීම ඉතා වැදගත් වේ.

7. වර්තමානයේ දී රටෙහි පවත්නා සෞඛ්‍ය පද්ධතිය විසින් වඩා හොඳ තත්ත්වයේ මානව සම්පත් දර්ශකයක් ළඟා කර ගැනීමට දායක වී ඇත. තවද, පසුගිය වසර කිහිපයක් මුළුල්ලේ පෞද්ගලික අංශය විසින් සෞඛ්‍යය සඳහා ඉහළ ආයෝජනයන් සිදු කරන තත්ත්වයක් තිබුණ ද රජය විසින් සෞඛ්‍ය සේවා පවත්වාගෙන යාම සඳහා අධික වියදමක් දරනු ලබන බව පෙනී යයි. එබැවින්, මේ පිළිබඳව මුදල් අමාත්‍යාංශය හා සෞඛ්‍ය අමාත්‍යාංශය එක්ව තවදුරටත් අධ්‍යයනය කළ යුතු බව නිර්දේශ කෙරේ. එමගින් රජයේ වියදම් ද්විකරණය වීම වළක්වා ගත හැකි අතර, සාමාන්‍ය මහජනතාව සෞඛ්‍ය සේවා වෙනුවෙන් දරනු ලබන පිරිවැය ද අවම කරගත හැකි වනු ඇත. මීට සමාන අධ්‍යයනයක් අධ්‍යාපන අංශය තුළ ද සිදු කළ යුතු බවට යෝජනා කෙරේ. තවද, සෞඛ්‍ය සේවා සඳහා "දායකත්ව ක්‍රමවේදයක්" හඳුන්වාදීම සිදු කළ යුතු වේ.

8. පළාත් ආණ්ඩුකාරවරුන්ගේ හා ප්‍රධාන ලේකම්වරුන්ගේ අවධානය යොමු විය යුතු සැලකිය යුතු ගැටළු විගණකාධිපතිගේ වාර්තා මගින් ඉස්මතු කර ඇත. මෙම තත්ත්වය තුළ පළාත් මට්ටමේ විගණන කමිටු විධිමත් අයුරින් රැස්වීම් පවත්වා එම ගැටළු පිළිබඳව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට සහ ඊට අදාල යෝජනා පළාත් සභාවලට ඉදිරිපත් කර පවත්නා දුර්වලතාවයන් නිවැරදි කරගැනීමට ක්‍රියා කළ යුතු බවට නිර්දේශ කෙරේ. ඒ අතර, පළාත් සභාවල ක්‍රියාත්මක වන අභ්‍යන්තර විගණන ක්‍රමවේදය හා පාලන යාන්ත්‍රණය ශක්තිමත් කරලීමට වගබලා ගත යුතු වේ.

ඉහළ මට්ටමෙන් සලකා බැලීම සඳහා හා ඒ අනුව සඵලදායී ක්‍රියාමාර්ග ගැනීම සඳහා මුදල් කොමිෂන් සභාව විසින් මෙම නිර්දේශ ඉදිරිපත් කරමු.

යූ.එච්.පලිහක්කාර
පත්කළ සාමාජික හා සභාපති

ඉන්ද්‍රජිත් කුමාරස්වාමි
නිල බලයෙන් සාමාජික හා ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

ආර්.එච්.එස්.සමරතුංග
නිල බලයෙන් සාමාජික හා මහා භාණ්ඩාගාරයේ ලේකම්

වී.කනගසභාපති
පත්කළ සාමාජික

එච්.එම්.සෆ්රුල්ලා
පත්කළ සාමාජික

## ඇමුණුම - 01: සාමූහික ප්‍රදාන වෙන් කිරීම හා මුදා හැරීම් (2015 - 2019)

(රු.මි.)

| පළාත | 2015 | | 2016 | | 2017 | | 2018 | | 2019 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වෙන් කිරීම | මුදා හැරීම් | වෙන් කිරීම | මුදා හැරීම් | වෙන් කිරීම | මුදා හැරීම් | වෙන් කිරීම | මුදා හැරීම් | වෙන් කිරීම | මුදා හැරීම් 2019 මැයි දක්වා |
| බස්නාහිර | 18,842 | 18,842 | 21,744 | 21,741 | 15,091 | 14,989 | 14,962 | 14,962 | 16,700 | 6,987 |
| මධ්‍යම | 23,542 | 23,542 | 23,375 | 23,374 | 23,320 | 23,233 | 25,894 | 25,894 | 29,000 | 12,112 |
| දකුණු | 21,459 | 21,459 | 20,508 | 20,507 | 21,033 | 21,084 | 23,807 | 23,807 | 23,200 | 9,725 |
| උතුරු | 16,268 | 16,268 | 16,757 | 16,754 | 17,078 | 17,034 | 19,035 | 19,035 | 20,550 | 8,606 |
| වයඹ | 21,705 | 21,634 | 20,829 | 20,821 | 21,866 | 21,788 | 22,463 | 22,463 | 24,250 | 10,118 |
| උතුරු මැද | 13,616 | 13,616 | 14,174 | 13,722 | 13,829 | 13,686 | 15,355 | 15,355 | 16,300 | 6,850 |
| ඌව | 16,237 | 16,237 | 16,422 | 16,249 | 16,115 | 15,971 | 16,268 | 16,268 | 17,900 | 7,587 |
| සබරගමුව | 18,410 | 18,410 | 18,219 | 18,218 | 19,350 | 19,281 | 21,828 | 21,828 | 22,300 | 9,350 |
| නැගෙනහිර | 17,475 | 17,475 | 17,166 | 16,996 | 18,668 | 18,430 | 20,482 | 20,482 | 20,500 | 8,600 |
| එකතුව | 167,554 | 167,483 | 169,194 | 168,382 | 166,350 | 165,496 | 180,094 | 180,094 | 190,700 | 79,935 |

මූලාශ්‍රය: මුදල් කොමිෂන් සභාව සහ මහා භාණ්ඩාගාරය

## ඇමුණුම - 02: පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන වෙන් කිරීම් හා මුදා හැරීම් (2015 - 2019)

(රු.මි.)

| පළාත | 2015 | | 2016 | | 2017 | | 2018 | | 2019 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වෙන් කිරීම | මුදා හැරීම් | වෙන් කිරීම | මුදා හැරීම් | වෙන් කිරීම | මුදා හැරීම් | වෙන් කිරීම | මුදා හැරීම් | වෙන් කිරීම | මුදා හැරීම් 2019 මැයි දක්වා |
| බස්නාහිර | 2,598 | 2,641 | 2,894 | 1,400 | 765 | 400 | 1,306 | 450 | 1,463 | 323 |
| මධ්‍යම | 3,879 | 2,575 | 3,684 | 1,353 | 1,169 | 1,800 | 1,996 | 1,350 | 2,236 | 634 |
| දකුණු | 3,997 | 2,211 | 2,246 | 874 | 1,168 | 1,778 | 1,994 | 1,300 | 2,233 | 608 |
| උතුරු | 5,038 | 2,399 | 3,199 | 1,800 | 1,657 | 2,327 | 2,830 | 1,828 | 3,169 | 904 |
| වයඹ | 2,500 | 2,151 | 3,216 | 1,505 | 1,228 | 1,800 | 2,097 | 1,500 | 2,348 | 694 |
| උතුරු මැද | 2,230 | 2,658 | 2,838 | 1,550 | 1,448 | 2,310 | 2,473 | 1,650 | 2,769 | 828 |
| ඌව | 3,361 | 2,229 | 2,736 | 1,100 | 1,682 | 1,790 | 2,873 | 1,983 | 3,218 | 955 |
| සබරගමුව | 4,360 | 2,966 | 2,913 | 1,042 | 1,365 | 1,500 | 2,331 | 1,700 | 2,611 | 778 |
| නැගෙනහිර | 2,469 | 1,830 | 3,297 | 1,510 | 1,544 | 1,952 | 2,637 | 1,839 | 2,953 | 887 |
| එකතුව | 30,432 | 21,660 | 27,026 | 12,134 | 12,026 | 15,657 | 20,537 | 13,600 | 23,000 | 6,611 |

මූලාශ්‍රය: මුදල් කොමිෂන් සභාව සහ මහා භාණ්ඩාගාරය

සටහන: වෙන් කිරීම්වල සංවර්ධන ව්‍යාපෘති ද ඇතුළත් වේ.

මුදා හැරීම් යටතේ දැක්වෙන්නේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන හා උපමාන පාදක ප්‍රදාන පමණි.

**ඇමුණුම - 03: උපමාන පාදක ප්‍රදාන වෙන් කිරීම් හා මුදා හැරීම් (2015 - 2019)**

(රු.මි.)

| පළාත | 2015 | | 2016 | | 2017 | | 2018 | | 2019 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වෙන් කිරීම් | මුදා හැරීම් | වෙන් කිරීම් | මුදා හැරීම් | වෙන් කිරීම් | මුදා හැරීම් | වෙන් කිරීම් | මුදා හැරීම් | වෙන් කිරීම් | මුදා හැරීම් 2019 මැයි දක්වා |
| බස්නාහිර | 525 | 2,641 | 460 | 200 | 254 | 100 | 254 | 60 | 254 | 20 |
| මධ්‍යම | 500 | 2,575 | 423 | 117 | 389 | 200 | 389 | 200 | 389 | 75 |
| දකුණු | 385 | 2,211 | 413 | 369 | 388 | 400 | 389 | 275 | 389 | 100 |
| උතුරු | 400 | 2,399 | 475 | 437 | 551 | 589 | 551 | 522 | 551 | 150 |
| වයඹ | 425 | 2,151 | 375 | 360 | 408 | 400 | 408 | 250 | 408 | 50 |
| උතුරු මැද | 375 | 2,658 | 400 | 400 | 482 | 300 | 482 | 250 | 482 | 50 |
| ඌව | 375 | 2,229 | 475 | 415 | 560 | 315 | 560 | 400 | 559 | 65 |
| සබරගමුව | 400 | 2,966 | 514 | 293 | 454 | 432 | 454 | 280 | 454 | 50 |
| නැගෙනහිර | 400 | 1,830 | 465 | 445 | 514 | 500 | 514 | 312 | 514 | 50 |
| එකතුව | 3,785 | 21,660 | 4,000 | 3,036 | 4,000 | 3,236 | 4,001 | 2,549 | 4,000 | 610 |

මූලාශ්‍රය: මුදල් කොමිෂන් සභාව සහ මහා භාණ්ඩාගාරය

**ඇමුණුම - 04: මූලාශ්‍ර අනුව පළාත් ආදායම් එකතුව - 2018**

(රු. '000)

| පළාත | මුද්දර බදු හා උසාවි දඩ ඇතුළත් ඉලක්ක 2018 | බලය පවරන ලද මූලාශ්‍රවලින් එකතු කළ ආදායම | | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | | ව්‍යාපාර පිරිවැටුම් බද්ද * | රථ වාහන ලියාපදිංචි ගාස්තු | සුරා බදු | අනෙකුත් ** | මුද්දර බදු | උසාවි දඩ | |
| බස්නාහිර | 23,725,000 | 846 | 4,244,750 | 649,350 | 2,313,894 | 17,284,580 | 955,860 | 25,449,280 |
| මධ්‍යම | 3,492,000 | 1,636 | 963,025 | 424,991 | 527,808 | 1,845,477 | 97,068 | 3,860,006 |
| දකුණු | 4,010,000 | 985 | 1,251,751 | 132,947 | 517,982 | 2,003,469 | 472,295 | 4,379,429 |
| උතුරු | 1,220,000 | - | 378,372 | 35,255 | 394,602 | 798,260 | 177,033 | 1,783,522 |
| වයඹ | 4,340,000 | 7,804 | 1,396,531 | 151,058 | 503,591 | 1,913,484 | 444,571 | 4,417,040 |
| උතුරු මැද | 1,490,000 | 792 | 604,011 | 64,313 | 600,336 | 167,162 | 237,681 | 1,674,295 |
| ඌව | 1,570,000 | 1,060 | 451,897 | 97,824 | 357,462 | 349,821 | 213,478 | 1,471,542 |
| සබරගමුව | 2,245,000 | - | 768,347 | 119,509 | 333,878 | 320,364 | 192,348 | 1,734,446 |
| නැගෙනහිර | 1,520,000 | - | 495,604 | 124,822 | 283,790 | 526,221 | 154,374 | 1,584,811 |
| එකතුව | 43,612,000 | 13,123 | 10,554,288 | 1,800,069 | 5,833,343 | 25,208,838 | 2,944,708 | 46,354,371 |

මූලාශ්‍රය: පළාත් සභාවල මාසික ආදායම් වාර්තා - 2018

* 2010 දක්වා ව්‍යාපාර පිරිවැටුම් බදු එකතුව

** අනෙකුත් ආදායම් තුළට බදු කුලී, පොළිය, විභාග ගාස්තු, ප්‍රාග්ධන වත්කම් විකිණීම හා ඔට්ටු බදු ආදිය අයත් වේ

**ඇමුණුම - 05: අරමුදල් වෙන් කිරීම් සූත්‍රයට අදාල තෝරාගත් විචලායයන් - 2020**

| පළාත | මධ්‍ය වාර්ෂික ජනගහනය **2017 (000')** | පළාත් දළ දේශීය නිෂ්පාදිතය **2017 (රු.මි.)** | දරිද්‍රතා රේඛාවට පහළින් සිටින පුද්ගල සංඛ්‍යාව | මධ්‍යනය මාසික ඒක පුද්ගල ආදායම 2016 (රු.) | එක් වෛද්‍ය නිලධාරියෙකු ට පුද්ගල සංඛ්‍යාව **2017** | විද්‍යා විෂයය ධාරාවෙන් විශ්වවිද්‍යාල ප්‍රවේශයට සුදුසුකම් ලද අයදුම්කරුවන් **2016 (%)** |
|---|---|---|---|---|---|---|
| බස්නාහිර | 6,081 | 4,949 | 102,476 | 14,400 | 805 | 30 |
| මධ්‍යම | 2,722 | 1,428 | 145,260 | 9,890 | 1,066 | 11 |
| දකුණු | 2,611 | 1,317 | 77,250 | 11,253 | 1,245 | 18 |
| උතුරු | 1,119 | 602 | 85,239 | 8,434 | 926 | 5 |
| වයඹ | 2,508 | 1,142 | 120,085 | 11,420 | 1,490 | 10 |
| උතුරු මැද | 1,349 | 749 | 66,879 | 11,268 | 1,320 | 4 |
| ඌව | 1,349 | 1,047 | 86,645 | 10,139 | 1,481 | 6 |
| සබරගමුව | 2,028 | 1,060 | 134,605 | 9,711 | 1,546 | 10 |
| නැගෙනහිර | 1,677 | 754 | 120,085 | 8,261 | 1,153 | 6 |
| **ශ්‍රී ලංකාව** | **21,444** | **13,048** | **938,524** | **94,776** | **11,032** | **100** |

**මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව, සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, විභාග**